**විමර්ශි 30**

## යුද්ධයෙන් නොනැවතුන වාරණය

පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් ආන්දෝලනාත්මක සහ ඛේදනීය පුවත් දිගින් දිගටම වාර්තා වන ආකාරය පසු ගිය කාලය තුළ මාධ්‍ය නිරීක්ෂණයේදී කැපී පෙනුනි. එක අතකින් උතුරේ අවතැන් සිසුන් මහ වැසි නිසා තමන්ගේ අසූචිත් කළවම් වූ වතුරේ සිට 23 වැනිදා පැවැත්වූ පහ වසර ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් වූහ. තවමත් පැවැත්වෙන උසස් පෙළ විභාගයට ලියමින් සිටිති. ඔවුන් විභාගවලට ලියන්නේ කුමණ තත්ත්වයක සිටදැයි කිසිවකුගේ අවධානයට යොමු වන්නේ නැතත් දකුණේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇතිවන කළබැගෑනි ජනමාධ්‍යවල විශේෂ අවධානයට ලක්වේ. විවිධ පුද්ගලයන්ගේ හා දේශපාලන පක්ෂවල හඬ නැඟීම්වලට ඉලක්ක වේ. කෙසේ වුවත් උතුරු මැද පළාතේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ බරපතල දෝෂ ගැන පාර්ලිමේන්තුව තුළ පවා විශාල ප්‍රශ්න කිරීම්වලට ලක් විය. විභාගවලට ප්‍රශ්න පත්‍ර ප්‍රමාද වී ලැබීම, අඩුවෙන් ලැබීම, වැරදි එක ලැබීම වැනි ප්‍රශ්න වෙන කවරදාටත් වඩා මතු වූ අතර මෙවර උසස් පෙළ විභාගයේදීද එවැනි ගැටළු මේ වනවිටත් මතු වී ඇති ආකාරය මාධ්‍ය වාර්තා අතර දක්නට ඇත. විදුහල්පතිවරුන් බඳවා ගැනීම සඳහා පැවැත්වූ විභාගයේ ලකුණු ගත්තවුන් නොතනා සිදු වන්නට ගිය අක්‍රමිකතාවන්ට විසඳුමක් ලෙස නීතියේ පිළිසරණ සොයන්නට සිදු විය. නමුත් එම ක්‍රියාවලියේදී පවා දුෂ්කර ප්‍රදේශවල ගුරුවරුන්ට සාධාරණයක් ඉටු නොවන තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු වී ඇති ආකාරය අසන්නට ලැබේ. එයට හේතුව එක් දිනක පුවත්පත් දැන්වීමකින් සාධාරණය ඉටු කරන්නට යෑමයි.

කෙසේ වෙතත් වඩාත් ආන්දෝලනයට තුඩු දුන් සිදු වීම් වූයේ පාසල් දෙකක සිසු සිසුවියන් සිය දිවි නසා ගැනීමට තැත් කිරීම හා තිදෙනෙකු ජීවිතක්ෂයට පත්වීමේ ඛේදවාචකයි. මෙම සිදුවීම් දෙක වාර්තා කිරීමේදීද සමහර මාධ්‍ය කළ වෙනස් සැලකීම නිරීක්ෂණය කළ හැකි විය. පසුව නම් ගම් සියල්ල හෙළි වුවද කොළඹ සිදුවීම වාර්තා වූයේ අගනුවර පෞද්ගලික බාලිකා විදුහලක සිදුවීමක් ලෙස වන අතර ඈත ගමේ පාසලේ සිදුවීම නම් ගම් සහිතව වාර්තා විය. මෙම වෙනස එක් සති අන්ත පුවත්පතක නිරීක්ෂණයට ලක් වී තිබිණ. මානුෂවාදී පුවත් වාර්තාකරණය මූලික කර ගෙන ලියන අපගේ තීරු ලිපිය මෙම සිදු වීම් පාදක කර ගෙන ලියන්නට සිදු වූයේ මෙම සිදු වීම් හරහා ගන්නට උත්සාහ දරන සහ ගෙන ඇති තීරණවලින් මානුෂවාදයට අදාල මෙන්ම අකෙතුත් සියළු අදහස් ප්‍රකාශ කිරීම්වලට එය අනතුරු ඇඟවීමක් නිසාය. ''පාසල් දරුවන්ගේ යහපතට කියා ගන්නට හදන මෙම තීරණවල සීමාව කොතැනකින් නතර වේද? එමගින් මේ රටේ ජනතාව කුමණ මූලධර්මවාදී පාලන රටාවකට ගෙන යාවිද?'' යනාදී කරුණු ගැන මේ රටේ මාධ්‍ය ජනතාව අවදි කිරීමේ සංවාදයකට එළඹ තිබේද යන කාරණය මෙහිදී අපගේ නිරීක්ෂණයට ලක් විය.

පසුගිය ජූලි මස 27 වැනිදා සිට අගෝස්තු මස 02 දක්වා සතියක කාලය තුළ කොළඹ ප්‍රධාන පෞද්ගලික පාසලක සිසුවියක් ටයි පටියෙන් ගෙල වැලලා ගෙන සිය දිවි නසා ගත් සිද්ධිය හා පොළොන්නරුවේ පාසලක සිසු සිසුවියන් කනේරු ඇට කා සිය දිවි නසා ගැනීමේ සිද්ධිය ගැන ජනමාධ්‍ය තුළ වැඩි අවධානයක් යොමු කොට තිබිණ. සිදු වීම් වාර්තා කිරීමට පොදුවේ සියළු කටයුතු කර තිබුණි. නමුත්, මෙම ඛේදවාචක පසු පස ඇති පාසල් පරිපාලනයේ හා ගුරු සිසු අනවබෝධයේ ඛේදවාචකය කරළියට ගෙන වර්තමාන ගුරු භූමිකාව ගැන කතිකාවක් ගොඩ නැගීම වෙනුවට මාධ්‍යයේ අවධානය කැපී පෙනුනේ පය බරවායට පිටිකර බෙහෙත් බඳින ආණ්ඩුවේ මූලධර්මවාදී තීරණ සාධාරණීකරණය කරන කතිකාවටය. පාසල් සිසුන්ට පමණක් නොව ගුරුවරුන්ටත් සෙලියුලර් දුරකතන තහනම් කිරීම පිළිබඳ පුවත් හා ඒ පිළිබඳ පුද්ගලයන්ගේ අදහස්, අසභ්‍ය වෙබ් අඩවි 12ක් තහනම් කිරීම, වැඩිහිටියන්ට පමණයි චිත්‍රපට තහනම් කිරීම මේ සිදුවීම් පසුපස හඹා ආ තහනම් නියෝගයන්ය. සිංහල පුවත්පත්වල මේ සිදුවීම් අළලා පුවත්/විශේෂාංග/කතුවැකි/කාටූන් 57 ක් පළ වී තිබූ අතර ඉංග්‍රීසි පුවත්පත්වල අවස්ථා 27ක් දක්නට ලැබිණ. දෙමළ පුවත්පත් ඒ සඳහා වෙන්කර තිබුණේ අවස්ථා 11කි. රූපවාහිනී මාධ්‍ය මගින් පුවතට හා තහනම් නියෝගවලට අදාල පුවත් 22ක් වාර්තා කළ අතර ගුවන් විදුලි මාධ්‍ය මගින් අදාල කාලය තුළ වාර්තා 7ක් දක්නට ලැබිණ. රජයේ මාධ්‍ය මගින් සිදුවීම හා රජයේ තහනම් නියෝග සාධාරණීකරණය කරන වාර්තාවලට ප්‍රමුඛතාවය ලැබුණු අතර පෞද්ගලික සමහර මාධ්‍ය මෙම තහනම් නියෝගවල සාධාරණ අසාධාරණ බව ගැන යම්

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

අදහසක් මතු කරන්නටද උත්සාහ ගෙන තිබිණ. විශේෂයෙන් සමහර ඉරිදා පුවත්පත්වලින් මෙම සිදුවීම්වලට අදාලව, වැඩිහිටියන්ට පමණයි චිත්‍රපට තහනම් කිරීමේ විහිළුව ගැන අදහස් ගොනු කරන්නට උත්සාහ ගෙන තිබිණ. දිනපතා පුවත්පත් කිහිපයක් කාටූන් මඟින් මෙම තීරණවල විහිළුකාර බව උපහාසයට නගා තිබිණ. නමුත් පීඩාකාරී පාසල් පාලනය තුළ කරළියට පැමිණි අවාසානාවන්ත සිදුවීම් හරහා ආණ්ඩුව කල දුටු කල වල ඉහගන්නට කරන උත්සාහය එතරම් ප්‍රබල ලෙස සමාජයට සන්නිවේදනය කරන්නට මාධ්‍ය උත්සාහ ගත් බවක් දක්නට ලැබුණේ නැත. මානුෂීය පුවත් වාර්තාකරණයේදීද පුවත් ගැන මිස එහි ඉදිරි දැක්ම ගැන අදහස් නොලියන දෙමළ පුවත්පත් මෙම සිදුවීම් සම්බන්ධයෙන්ද පුවතට සීමා වී ඇත. නමුත් විවිධ මූලාශ්‍ර සොයමින් දෙමළ ජනතාවට අදාල සිදුවීමේ බරපතල බව අවධාරණය කරන්නට ගන්නා උත්සාහය මෙම සිදුවීමේදී දක්නට නැත.

සෙලියුලර් දුරකතන ආණ්ඩුව තහනම් නොකළත් කාවින්දි සිසුවිය සිය දිවි නසා ගත්තේ පාසල්වල එය තහනම් වී තිබීම නිසාය. එම සිදුවීම පසුපස ඇති සැඟවුණු රහස් හෙළිදරව් කර පාසල් පාලනයේ වැඩවසම් තත්ත්වයන් අනාවරණය කර ගන්නට පොදුවේ මාධ්‍යයට හැකියාවක් ලැබුණේ නැත. ලෝකයම සන්නිවේදන තාක්‍ෂණය තුළ ඇතැඹුලක් වී ඇති කලෙක ගුරුවරුන්ටත් එය තහනම් භාණ්ඩයක් කිරීම සාධාරණීකරණය වන තැනට සමාජය නිහඬය. උගන්වන කාලය තුළ භාවිතය බාධාවක් නමුත් ශ්‍රී ලංකාවේ සියළු වැඩ කරන ක්‍ෂේත්‍රවලට එම තහනම වලංගු නොවන්නට ඇති සහතිකය කුමක්ද? ''වැඩිහිටියන්ට පමණයි'' ලේබලය චිත්‍රපටයකට ලබා දෙන්නේ ඒවා ළමයින්ට තහනම් නිසාය. අප ජීවත් වන්නේ ඒවා වැඩිහිටියන්ට තහනම් කිරීමේ විහිළුව, විහිළුවකින් නතර වන යහ පාලනයක් සහිත සමාජයකද? කලා ක්‍ෂේත්‍රයෙන් ප්‍රබල හඬක් මතු විය යුතු අවස්ථාවක ඉඳහිට යමෙකු ඉතා ලිස්සන සුළු ලෙස තමාගේ නිර්මාණයේ සීමාව බේරා ගෙන කරන සුළු ප්‍රකාශයක් දෙකක් මේ කාලය තුළ මාධ්‍ය මඟින් දක්නට ලැබිණ. වැඩිහිටියන්ට පමණයි ලේබලය යටතේ නිර්මාණය වූ සියළු සම්භාව්‍ය චිත්‍රපට නිර්මාණකරුවන්, ඒවාට දායක වූවන්, ඒවාට සම්මාන ලබා දුන්නවුන්ගේ හඬ මේ අවස්ථාවේ නොනැගෙන්නේ මන්ද? ඔවුන්ගේ නිර්මාණ යුගය අවසන්ව ඇති නිසාද? නැතිනම් ඔවුන්ගේ හඬ මාධ්‍යයට ඇසෙන්නේ නැති නිසාද? මානුෂවාදී පුවත්/යුද පුවත් වාර්තාකරණයේදී පැවැති වාරණයම, ආණ්ඩුවේ සියළු මූල ධර්මවාදී තීරණ සඳහාත් ක්‍රියාත්මක වන නිසාද? දියුණු ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයෙන් ශ්‍රී ලංකා වාසීන් ඈත් කොට මූල ධර්මවාදී කොදෙව්වකට ඇද දමන මෙම අවිචාරවත් තීන්දු තීරණ ඉදිරියේ අවම වශයෙන් දසකයක ඉදිරි දැක්මකින් යුතුව ජනමාධ්‍ය ක්‍රියා නොකළහොත් සිදු වන්නේ ලෝකයේ අවමානයට ලක් වී ඇති පාලන මොඩලයකට ශ්‍රී ලංකාව අපගමනයක යෙදෙන හැටි බලා සිටින්නට නොවේද? සිවිල් සමාජය, විද්වතුන් හා දේශපාලනඥයන් අතර සහසම්බන්ධය ගොඩ නැගීමේ ප්‍රබල අතරමැදියා විය හැකි ජනමාධ්‍යයට ශ්‍රී ලාංකික සමාජය මෙම අපගමනයෙන් මුදවා ගැනීමේ මාර්ගෝපදේශකයා විය හැකිය. එහෙත්, මේ සහසම්බන්ධයෙන් රාව ප්‍රතිරාව නැගෙන හඬ තවමත් ජනමාධ්‍ය හරහා නම් ඇසෙන්නේ නැත.

**සීතා රංජනී**
**seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com